# පකරණ, පකරණ නය හා පකරණ පාළිය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්. ඇම්. දේශප්‍රිය ගුණසේන

## පකරණ යන්නෙහි අර්ථ පරිසය

ප + කර කරණෙ - කිරීම් අර්ථ ඇති ධාතුවට යු ප්‍රත්‍යයාන්ත අතීත කාල කිතක පදයක් ලෙස පද සිද්ධ යි මෙහි යු ප්‍රත්‍යයට අන ආදේශ වීමෙන් ප+කර+යු+අන පකරණ වී තිබේ. පකරණ යන්නට කෝෂ ග්‍රන්ථයන්හි අර්ථ රැසක් ලබා දී තිබේ. මඩිතියවෙල සුමංගල හිමියෝ පාලි-සිංහල ශබ්ද කෝෂයෙහි ප්‍රකරණය, ග්‍රන්ථය, විශිෂ්ට ක්‍රියාව යැයි අර්ථ තුනක් ලබා දෙති. පුවසති අලගියවන්න, සංස්කෘත-සිංහල ශබ්ද කෝෂයෙහි. කාරුණ, කොටස, විෂය, අංගය, තැන, හැඳින්වීම, නාට්‍ය විශේෂයක්, පොත, ආදරය, ගරු කිරීම, හැඳින්වීම යැයි අර්ථ එකොළොසක් ඉදිරිපත් කරයි. සිරි ලියනගේ, බෞද්ධ ශබ්ද කෝෂයෙහි මූලික අර්ථ දෙකක් ලබා දෙයි. එනම්, ග්‍රන්ථය, පොත, පුස්තකය යැයි එක් අර්ථයක් ද පිටකයක කොටස, පොතක එක් අංගයක්, පරිවාර ග්‍රන්ථය, ධර්ම සංග්‍රහය යනු ආදි වැනි අර්ථයන් ය. මහාචාර්ය, රීස් ඩේවිඩ්ස් **Pali English Dictionary** හි පකරණ යන්නට Performance, Undertaking Paragraph - (of the law), Occasion, exposition, Arrangement, Literary Work, Composition, Book, Usually in only titles අර්ථ රැසක් ඉදිරිපත් කරයි. මහාචාර්ය, ජී. පී. මලලසේකර ඉංග්‍රීසි - සිංහල ශබ්දකෝෂයෙහි අර්ථ දක්වා ඇත්තේ, Performance යන්න ක්‍රියාව, කෘතිය ලෙසත්, Undertaking Paragraph - (of the law) යන්නට නීතියෙහි යටින් තිබෙන ඡේදය ලෙසත්, Occasion යන්නට අවස්ථාව, සිද්ධිය, ඉඩ, හේතුව, චුවමනාව ලෙසත්, exposition යන්නට ප්‍රකාශනය, ප්‍රදර්ශනය ලෙසත්, Arrangement යන්නට පිළිවෙල කිරීම, සකස් කිරීම ලෙසත්, Literary Work යන්නට ශාස්ත්‍රීය වැඩ ලෙසත්,